මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

**පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01. මෙම බුද්ධ ප්‍රතිමාව අනුරාධපුරයේ ...................................................................... නම් ග්‍රාමයේ අශෝකාරාම විහාරයේ දැකිය හැකි ය.

02. පූර්ණ උන්නතව නෙලා ඇති මෙම ප්‍රතිමාව වැඩසිටින්නේ ................................................................ ක්‍රමයට යි.

03. දකුණතින් විතර්ක මුද්‍රාව දැක්වෙන අතර වමතින් ............................................... මුද්‍රාව පිළිබිඹු වන බවට විචාරක මතයක් පවතී.

04. බුදුන්ගේ මහා කරුණාව සහිත .................................................. මෙම බුදු පිළිමයෙන් මතුකර දැක්වේ.

05. ක්‍රි.ව. 5-6 සියවස්වලට අයත් ලෙස සැලකෙන මෙම බුද්ධ ප්‍රතිමාවෙන්....................................................කලා ලක්ෂණ දැකිය හැකි බව විද්වත් මතයයි.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06. ගල් විහාරයේ පූජා භූමියේ සමාධි බුදු පිළිමයේ පිළිබිඹු වන නිර්මාණ අංග මගින් කුමන කලා සම්ප්‍රදායක් මතුකොට තිබේ ද? ............................................................................

07. iv වන බුවනෙකබාහු රජ කාලයට අයත් ලංකා තිලක විහාරයේ නිර්මාණ ශිල්පියා නම් කරන්න. ..............................................................................................................................................

08. ස්වභාවික හා තාත්වික හැඩ දැක්වීම වෙනුවට නිරූපණාත්මක සහ වියුක්ත හැඩ භාවිතා කරමින් හෙන්රිමුවර් නැමැති මූර්ති ශිල්පියා කරන ලද නිර්මාණය කුමක්ද?...................................................................................

09. සම්භාව්‍ය යුගයට අයත් අඩි 48 පමණ උස ඇතීනා දෙවඟනගේ රුව කාගේ නිර්මාණයක් ද? .........................................................................................

10. ඉන්දියාවේ අජන්තා චිත්‍ර අතර 17 වන ගුහාවේ දැකිය හැකි අප්සරා රූප හා සමාන වන ශ්‍රී ලංකාවේ ඇති සිතුවම් මොනවාද? ..............................................................................................................................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. තිවංක පිළිමගෙයි චිත්‍ර
    i. ශ්‍රී ලාංකීය චිත්‍ර කලා විකාශනයේ යුග දෙකක චිත්‍ර කලා ශෛලිය ලක්ෂණ මෙහි පිළිබිඹු වේ.
    ii. මෙහි ඇති සිතුවම් ශෛලිය පොළොන්නරු යුගයේ වෙනත් ස්ථානයක දක්නට නොමැත.
    iii. දක්නට ඇති සිතුවම් ශෛලිය ඉන් පෙර යුගයට බලපා ඇත.

12. නටරාජ් මූර්තිය
    i. අංක 05 දරණ හින්දු කෝවිලෙන් හමු වූ හින්දු ආගමික මූර්තියකි
    ii. ශිවගේ දේවිය වූ පාර්වතී දෙවඟනගේ රූපය පිළිබිඹු වේ.
    iii. ශිව හෙවත් ඊශ්වර දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාශය පෙන්නුම් කරයි
    iv. සුන්දර මූර්තිස්වාමි නැමැති ශිව භක්තිකයා නිරූපණය කරයි.

13. කැලණි විහාරයේ හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කැවීම දැක්වෙන සිතුවම නිර්මාණය කරන ලද්දේ,
    i. සෝලියස් මෙන්ඩිස් ශිල්පියා ii. ඩේවිඩ් පේන්ටර් ශිල්පියා
    iii. A.C.G.S.අමරසේකර ශිල්පියා iv. තිස්ස රණසිංහ ශිල්පියා

14. කේ. කනකසභාපති විසින් කැන්වසය මත තෙල්සායම් මාධ්‍යයෙන් අඳින ලද කියවන ළමයා නැමැති සිතුවම,
    i. ශෛලිගත හා සනිකාදිවාදි කලා ලක්ෂණවල අන්‍යනය සහිතව නිර්මාණය කොට ඇත.
    ii. විහාර සිතුවම් කලාවේ ආභාසය ලැබී ඇත.
    iii. අනුරාධපුර යුගයේ සිතුවම් ශෛලිය අනුව නිමවා ඇත.
    iv. අජන්තා, භාග් වැනි ශෛලීන් මිශ්‍රව ඇඳ ඇත.

15. දියසායම් මාධ්‍යයෙන් තම ප්‍රවීනත්වය ලොවට කියාපෑ ශිල්පියෙකු වන්නේ,
    i. තිස්ස රණසිංහ ii. ස්ටැන්ලි අබේසිංහ iii. A. මාර්ක් iv. G.S. ප්‍රනාන්දු

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.**

16. තිරිඟි තලය :...............................................................................................................

17. සිරස් පත :...............................................................................................................

18. ස්ක්‍රයිබ් :...............................................................................................................

19. මඩොල් කුරුපාව :.......................................................................................................

20. ගෝපුර :...............................................................................................................

- **සටහන් අතුරින් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21.  (............)  A

22.  (............)  B

23.  (............)  C

24.  (............)  D

25.  (............)  E

- **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචන/වචනය යොදා සම්පූර්ණ කරන්න**

26. 43 කණ්ඩායමේ ශිල්පීන් නිරූපණය වන පරිදි .......................................... කාටුන් ශිල්පියා විසින් කාටුන් සිතුවම නිමවා ඇත.

27. ආකාශ පර්යාවලෝකනය දැක්වෙන පරිදි නිමවා ඇති අනෝතත්තවිල නම් වූ බිතු සිතුවම ........................................................................... ලෙන් විහාරයේ දක්නට ඇත.

28. මුදලිඳු A.C.G.S. අමරසේකර විසින් 'විරැකියාව' නමින් නම් කර ඇති මෙම සිතුවම වඩාත් ප්‍රසිද්ධියටපත්ව ඇත්තේ .......................................... යනුවෙනි.

29. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් අතර අඩි 17 ක් දිග ගවරුව ......................................................... ගුහාවතුළ දක්නට ඇත.

30. ඊජිප්තු අමර්ණා යුගය හෙවත් නවරාජධානි සමයේ නිම වූ ...................................................... ආධිරාජිනියගේ රුව බර්ලින් කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

මතුගම අධ්‍යාපන කලාපය

- අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන ලෝකඩ ප්‍රතිමාවෙන් ........................................... නැමැති ශිව භක්තිකයා නිරූපණය වේ.

32. G අක්ෂරයෙන් දැක්වෙන නම්නොකළ යනුවෙන් හැඳින්වෙන පිළිරුව නිර්මාණය කළ ප්‍රතිභාපූර්ණශිල්පියා ...................................................................... ශ්‍රී ලාංකිකයෙකි.

33. H අක්ෂරයෙන් දැක්වෙන ගුප්ත යුගයේ නිර්මාණය වූ මෙම බුදු පිළිමයේ ................................................... මුද්‍රාව නිරූපණය කරයි.

34. I අක්ෂරයෙන් දැක්වෙන පෙම්යුවළ කැටයම ................................................. කලා සම්ප්‍රදායේ කලා ලක්ෂණ පෙන්වන නිර්මාණයකි.

35. J අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මෙම පූජකරුව සොයාගෙන ඇත්තේ ........................................................ නගරයෙනි.



- ඉහත දක්වා දී ඇති උපමාතෘකාවලට අදාලව අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න.

36. තේමාව : ..........................................................................................................

..........................................................................................................

37. ශිල්පියා : ..........................................................................................................

..........................................................................................................

38. දැනට ඇති ස්ථානය : ..........................................................................................................

..........................................................................................................

39. ශිල්පක්‍රමය : ..........................................................................................................

..........................................................................................................

40. සම්පිණ්ඩනය : ..........................................................................................................

..........................................................................................................

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව II | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

## ද්‍රව්‍ය සමූහයේ දළ සැලැස්ම



| | | |
|---|---|---|
| **චිත්‍ර කලාව II** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 02 යි** |

**නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
  1. රේඛා මඟින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
     මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙපෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.
     මේ සඳහා සපයා ඇති විශේෂ කඩදාසිය භාවිත කරන්න.

- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.
  - රේඛා අධ්‍යයනය
    1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා
  - වර්ණ චිත්‍රය
    2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
    3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
    4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
    5. වර්ණ හැසිරවීම ශිල්පීය කුසලතා
    6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

❖ සැලකිය යුතුයි: ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව III | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**සැලකිය යුතුයි.**

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුබිමේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍රයට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දිය සායම්, පැස්ටල් සායම්, පෝස්ටර් සායම් අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකිය.

- **''අ'' කොටස, ''ආ'' කොටස හෝ ''ඉ'' කොටසින් සුදුසු මාතෘකාවක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

### ''අ'' කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික අවස්ථාවක සිත් ගන්නා මොහොතක්
2. ගොවිපලක හෝ වැඩබිමක වැඩෙහි යෙදෙන පිරිසක්
3. වන සතුන් ගහණ වනෝද්‍යානයක්
4. ධීවර කටයුතුවල නිරතවන ධීවරයින්

### ''ආ'' මෝස්තර කොටස

5. මල්, කොළ, ගෙඩි යොදා ගනිමින් චිත්ත මෝස්තරයක් සඳහා සුදුසු නිර්මාණයක්
6. සාම්ප්‍රදායික මෝස්තර ඇසුරු කරගෙන වෘත්තාකාර හැඩයෙන් යුත් පිත්තල බන්දේසියක්
7. චතුරස්‍රාකාර කුෂන් කවරයක් සඳහා ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් නිර්මාණය කොට සුදුසු වර්ණ යොදන්න.

### ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. කොරෝනා වසංගතයෙන් වැළකීම සඳහා ගත යුතු සෞඛ්‍යමය ක්‍රියාමාර්ග පිළිබඳව මහජනතාව

   දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් ඇඳ වර්ණ කරන්න.
9. ළමා පොතකට පිටකොළයක්, සුදුසු නමක් යොදා ගනිමින් වර්ණ කරන්න.
10. පාසලේ පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය

# පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව I | 11 ශ්‍රේණිය | පිළිත=රු පත්‍රය |
|---|---|---|

01. පන්කුලිය
02. වීරාසන
03. කටක හස්ත මුද්‍රාව
04. අධ්‍යාත්මික
05. ගුප්ත
06. මහායාන
07. ස්ථපතිරායි
08. රජ පවලු
09. වීඩියස්
10. සීගිරිය
11. ශ්‍රී ලාංකීය චිත්‍ර කලා විකාශනයේ යුග දෙකක චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ මෙහි පිළිබිඹු වේ.
12. ශිව හෙවත් ඊශ්වර දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසය පෙන්නුම් කරයි.
13. සෝලියස් මැන්දිස්
14. ශෛලිගත හා සණිකවාදී කලා ලක්ෂණවල ආභාසය
15. ඨගීග ප්‍රනාන්දු
16. වකදෙක ඇඳීමෙන් පසු දෙනු ලබන දෙව අභ්‍යාසය
17. බුදු පිළිමවල සිරසට ඉහළින් ඇති කොටස
18. මිසර මූර්ති ආකාර ඇති ලියන්නා මූර්තිය
19. ඇම්බැක්කේ දේවාලයේ පරාල 26 ක් එක් ලී ඇණයකට සම්බන්ධකොට ඇති ගෘහ නිර්මාණ අංගය
20. හින්දු කෝවිල්වල ඉහළ අහසට විහිදුන කලාත්මක ගෘහ නිර්මාණය
21. D
22. E
23. A
24. C
25. B
26. ඔබ්රි කොලට්
27. දඹුල්ල
28. වඩුවාගේ ගෙදර
29. ලැස්කො
30. නෙෆරටරි
31. සුන්දර මූර්තිස්වාමි
32. H.A. කරුණාරත්න
33. ධම්ම චක්ක
34. ගුප්ත
35. මොහෙන්දෝජාරෝ
36. අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය
37. ලියනාඩෝ ඩාවින්චි
38. ශාන්තමරියා ඩෙලාශ්‍රේඩි
39. මෙම සිතුවම මධ්‍යයේ ජේසුස් වහන්සේ දක්වා ඇති අතර දෙපස අනුගාමිකයන් 12 කි. ජුදාස් නැමැති පාවා දෙන්නාගේ මුහුණෙහි ඇති කුතුහලය මැනවින් නිරූපණය කර ඇත.
40. අවකාශමය පර්යාවලෝකය අනුව සිතුවම ඇඳ ඇත. වර්ණ ගැන්වීමේදී දුඹුරු වර්ණයේ ප්‍රභේද සහිත අඳුරු වර්ණ
    මාලාවක් භාවිතා කර ඇත.
    ත්‍රිමාන හා පර්යාවලෝක ලක්ෂණ
    කියරෝස්කුරෝ වර්ණගැන්වීමේ සිද්ධාන්තය
    ශ්‍රී ලාංකීය චිත්‍ර කලා විකාශනයේ යුග දෙකක චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ මෙහි පිළිබිඹු වේ.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

➢ **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**නම/විභාග අංකය -..............................................**

➢ පහත සඳහන් ඡායාරූප ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. අව්වැසි ආදියෙන් ආරක්ෂා කිරීම සඳහා කුඩා ස්තූප වටා තැනූ මෙය ................................................ ලෙස හඳුන්වනු ලැබේ.
2. නිශ්ශංකමල්ල රජතුමාගේ නිර්මාණයක් ලෙස සලකන මෙය ................................................ රජුගේ නිර්මාණයක් වශයෙන් ද අනුමාන කෙරේ.
3. පොළොන්නරුවේ ........................................................................ ඇතුළු වූ විට වම්පසින් මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත.
4. පොළොන්නරු යුගයේ කලාත්මක සඳකඩපහණ සහ ........................................................................ හමුවන්නේ මෙහි උතුරු පිවිසුම් දොරටුවෙනි.
5. මෙහි සතර පැත්තේ ඇති බුදු පිළිමවල ඇති සුවිශේෂත්වය වන්නේ චීවරය රැලි රහිත වන අතර හිසකෙස් ........................................................................රහිත ව දක්වා ඇත.

➢ අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

6. දෙගල්දොරුව විහාරයේ වෙස්සන්තර ජාතකය සිතුවම් කළ ශිල්පියා කවු ද?
   ........................................................................
7. බුද්ධ චරිතය අනුපිළිවෙළින් චිත්‍රාවලියක් සේ චිත්‍රණය කර ඇති කොළඹ යුගයේ ඉදි වූ සුප්‍රසිද්ධ විහාරස්ථානය කුමක් ද? ........................................................................
8. හොඳම සඳකඩපහණ ලෙස සැලකෙන බිසෝ මාළිගයේ සඳකඩපහණ නිර්මාණය කිරීමට යොදා ගත් ශිල්ප ක්‍රමය කුමක් ද? ........................................................................
9. ගම්පොළ යුගයේ ඉදි වූ ගඩලාදෙණි විහාරයේ නිර්මාණ ශිල්පියා කවු ද?
   ........................................................................
10. "සිරිත්තරන් " නමැති පුවත්පත පළ කරමින් "සිරිත්තරන් සුන්දරන්" යන නමින් ප්‍රසිද්ධියට පත් දෙමළ කාටුන් චිත්‍ර ශිල්පියා කවු ද? ........................................................................

මතුගම අධ්‍යාපන කලාපය

➢ අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. මයිකල් ආන්ජලෝ විසින් සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ සිතුවම් කරන ලද සුවිසල් ප්‍රෙස්කෝ සිතුවමින්

   I. අන්තිම විනිශ්චය නිරූපණය කෙරේ.
   II. ලෝකෝත්පත්ති කථාව නිරූපණය කෙරේ.
   III. අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය නිරූපණය කෙරේ.
   IV. ආදම් මැවීම නිරූපණය කෙරේ.

12. ඉසුරුමුණියෙහි පිහිටි ගලෙහි නෙළා ඇති ඇතුන් දිය කෙළින විලාසය දැක්වෙන කැටයමින්

   I. චෝල කලා ලක්ෂණ නිරූපණය කරයි.
   II. ගුප්ත කලා ලක්ෂණ නිරූපණය කරයි.
   III. පල්ලව කලා ලක්ෂණ නිරූපණය කරයි.
   IV. පාණ්ඩ්‍ය කලා ලක්ෂණ නිරූපණය කරයි.

13. ඉන්දු නිම්නයෙන් හමු වූ මුද්‍රා අතර ශිව දෙවියන්ගේ මූලාදර්ශයක් සේ සැලකෙන්නේ

   I. ව්‍යාඝ්‍රයන් සමඟ පොරට සැරසෙන මිනිසා දැක්වෙන මුද්‍රාවයි.
   II. අං සහිත දෙවියා දැක්වෙන මුද්‍රාවයි.
   III. නන්දි රූ ඇතුළත් මුද්‍රාවයි.
   IV. වෘක්ෂ වන්දනාව දැක්වෙන මුද්‍රාවයි.

14. සාංචි තොරණේ හර්මිකාව වෙනුවට ශ්‍රී ලංකාවේ චෛත්‍යයට එක් වූයේ

   I. පේසා වළලුයි.   II. කොත් කැරැල්ලයි.
   III. හතරැස් කොටුවයි.   IV. දේවතා කොටුවයි.

15. මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය තුළ කන්ද උඩරට චිත්‍ර අතුරෙන් පහතරට චිත්‍ර වෙනස් වනුයේ

   I. කාලීන හා ප්‍රාදේශීය ලක්ෂණ එකතු වීම නිසා ය.
   II. චිත්‍ර ප්‍රමාණයෙන් විශාල වීම නිසා ය.
   III. පසුතලයේ වර්ණය වෙනස් වීම නිසා ය.
   IV. ස්වභාවිකත්වයට බරවීම නිසා ය.

මහරගම අධ්‍යාපන කලාපය

➢ අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. කෝලම් රටා - ..........................................................................................................
17. අරිම්බුව - ..........................................................................................................
18. නියඳ කෙඳි - ..........................................................................................................
19. වර්ණ පර්යාලෝකය - ..........................................................................................................
20. පද්ම නිධි -..........................................................................................................

➢ අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන ඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත යොදන්න.

21.  (..........................) A. 

22.  (..........................) B. 

23.  (..........................) C. 

24.  (..........................) D. 

25.  (..........................) E. 

➢ අංක 26 සිට 30 තෙක් දී ඇති එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

26. ක්‍රි.පූ. 1 වන සියවසේ වළගම්බා රජු විසින් කරවන ලදැයි සැලකෙන නුවර යුගයේ ආවේණික ලක්ෂණ සහිත චිත්‍ර හා මූර්ති රැසක් ඇති ලෙන් පහකින් යුතු .................................................... විහාරය ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශාල ම ලෙන් විහාරයයි.

27. ලෙන් 29කින් යුත් අජන්තා ලෙන් පන්තිය ................................................ හැඩයට පිහිටා ඇත.

28. "සඳ පායා" නම් වූ සිතුවම භාවාත්මක ප්‍රකාශනය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික ශිල්පියෙකු වන ..................................................ගේ උසස් කෘතියකි.

29. කාන්තාවන් කිහිප දෙනෙකුගේ විවිධ ඉරියව් එක් කරමින් පාරම්පරික ශිල්පීන් විසින් කළයක හැඩයට නිර්මාණය කර ඇති මෝස්තරය .................................................. නමින් හැඳින් වේ.

30. පවතින සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික දුර්වලතා පිළිබඳ හාස්‍යය දනවන අයුරින් විවරණය කිරීම ................................................ නිර්මාණවල අරමුණ වන්නේ ය.

➢ අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූපසටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

    

F G H I J

31. F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම් කොටස අයත් සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..........................
32. G අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමයේ දැක්වෙන මුද්‍රාව කුමක් ද? ....................................................................
33. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවමේ වර්ණ මාධ්‍යය කුමක් ද? ....................................................................
34. I අක්ෂරයෙන් දක්වා ඇති ප්‍රතිමාවේ දෑත දරා ඇති දෙයින් කුමක් සංකේතවත් වේ ද? ..................................
35. J අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණය, නිර්මාණය කර ඇති ශිල්ප ක්‍රමය කුමක් ද?
.....................................................................................

➢ පහත සඳහන් කලා කෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.( තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)



36. ස්ථානය හා යුගය -
.......................................................................................................................................
37. තේමාව -
.......................................................................................................................................
38. ශිල්පියා -
.......................................................................................................................................
39. මාධ්‍ය භාවිතය/ශිල්ප ක්‍රමය -
.......................................................................................................................................
40. ශිල්පීය කුසලතා -
.......................................................................................................................................

පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව II | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

# ද්‍රව්‍ය සමූහයේ දළ සැලැස්ම



මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව II | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

### නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
    1. රේඛා මඟින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
    2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙපෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.
    - නිදහස් රේඛා අධ්‍යයනය
        - මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා
    - වර්ණ චිත්‍රය
        - ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
        - පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
        - දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
        - වර්ණ හැසිරවීම ශිල්පීය කුසලතා
        - උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

❖ සැලකිය යුතුයි: ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව III | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**සැලකිය යුතුයි.**

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හෝ නම චිත්‍ර කඩදාසියේ පසු පිටේ ලියන්න. චිත්‍ර මාතෘකා අංකය ද සටහන් කරන්න.
- දිය සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම මාධ්‍යයක් භාවිතා කළ හැකි ය.(පෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- අ. කොටසින්, ආ. කොටසින් හෝ ඉ. කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

**<u>අ. කොටස - චිත්‍ර සංරචනය</u>**

1. බෝ සෙවනේ භාවනාවේ යෙදෙන සිල් ගත් උවැසියෝ/ කෝවිලක/පල්ලියක ආගමික වතාවත්වල යෙදෙන බැතිමතුන්
2. නියං සමයේ ජලය සොයා යන මිනිසුන් හා ගැහැනු
3. දිය කඩිත්තකින් දිය බොන මුව රංචුවක්
4. හේනක හෝ කුඹුරක අස්වනු නෙළන මිනිසුන්

**<u>ආ. කොටස - මෝස්තර නිමර්ාණය</u>**

5. නිවස තුළ අලංකාරය පිණිස තැබිය හැකි මැටි බඳුනක් ඇඳ වර්ණ කරන්න.
6. මේස රෙද්දකට උචිත මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. සිංහල සැරසිලි මෝස්තර භාවිත කරමින් පිත්තල බන්දේසියක් ඇඳ උචිත වර්ණ යොදා වර්ණ කරන්න.

**<u>ඉ. කොටස - ග්‍රැෆික් චිත්‍ර</u>**

8. නවතම සබන් වර්ගයක් වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා ප්‍රචාරක දැන්වීමක් නිර්මාණය කරන්න.
9. ''සුන්දර පරිසරය සුරකිමු.'' යන තේමාව යටතේ වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පාසල් කලා උළෙල සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

(මුළු ලකුණු 30)

මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| චිත්‍ර කලාව I | 11 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය |
|---|---|---|

1. වටදාගෙය/චෛතියඝර/ථූපඝර/දාගෙය
2. පරාක්‍රමබාහු
3. දළදා මළුවට
4. මුරගල
5. අක්බමරු
6. දෙවරගම්පළ සිල්වත් තැන
7. ගෝතමී විහාරය
8. අල්ප උන්නත නෙළීමේ ශිල්ප ක්‍රමය
9. ගනේෂ්වරාචාර්ය
10. සී සිවඥානසුන්දරම්
11. (1) අන්තිම විනිශ්චය නිරූපණය කෙරේ.
12. (3) පල්ලව කලා ලක්ෂණ නිරූපණය කෙරේ.
13. (2) අං සහිත දෙවියා දැක්වෙන මුද්‍රාවයි.
14. (2) හතරැස් කොටුවයි.
15. (1) කාලීන හා ප්‍රාදේශීය ලක්ෂණ එකතුවීම නිසා ය.
16. දෙමළ ජනතාව උත්සව අවස්ථාවල දී ගෙබිම සැරසීම සඳහා දමනු ලබන රටා කෝලම් රටා වේ.
17. සිංහල සැරසිලි මෝස්තරවල නිර්ජීවී කොටසට අයත් මෝස්තර රටාවකි.
18. නියඳ කෙඳි භාවිතයෙන් කලාල විවීම දුම්බර ප්‍රදේශයේ ප්‍රචලිත ව පැවති ජන කලාවකි.
19. ළඟ ඇති වස්තූන් තද වර්ණයෙනුත් දුර ඇති වස්තූන් ළා වර්ණයෙනුත් දැක්වීම වර්ණ පර්යාලෝකය වේ.
20. පද්මයක් හිසින් දරාගෙන සිටින බහිරව රූප සහිත මුරගල් පද්ම නිධි ලෙස හැඳින් වේ./ පද්ම නිධි මුරගලක් අභයගිරි දාගැබේ පිවිසුම් දොරටුවේ දක්නට ඇත.

21. C 22. A 23. E 24. B 25. D

26. දඹුලු ලෙන්
27. අශ්ව ලාඩමක
28. එච්.ඒ. කරුණාරත්න
29. පංච නාරී ඝට්ය
30. කාටුන්
31. සෝලියස් මෙන්දිස්
32. ධම්මචක්ක මුද්‍රාව
33. දිය සායම්
34. රාජ්‍යත්වයේ සංකේතය
35. වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය
36. ඇම්බැක්කේ දේවාලයේ මෙම කැටයම දක්නට ලැබෙන අතර ගම්පොළ යුගයට අයත් ය.
37. මල්ලව පොරය මෙම කැටයම තුළින් නිරූපිත ය.
38. දෙල්මඩ මූලාචාර්ය විසින් මෙම කැටයම නිමර්ාණය කර ඇත.
39. දැව මාධ්‍ය භාවිතයෙන් අල්ප උන්නත නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිතා කරමින් මෙම කැටයම නිර්මාණය කර ඇත.
40. මෙම කැටයමේ රේඛාව ඉතා සියුම් ව හසුරුවා නෙළීම සිදු කර ඇත./ එකල සමාජයේ පැවති ක්‍රීඩා පිළිබඳ කලාකරුවා අපූර්වත්වයෙන් බලා කළ නිර්මාණයකි./කැටයම වටා සාම්ප්‍රදායික සිංහල සැරසිලි අංග වන ගල් බිංදුව සහ කුන්දිරකන් රටා ඉතා සියුම් ලෙස යොදා ගනිමින් කැටයමේ කලාත්මක බව තීව්‍ර කර ඇත.